# BUSINESS FOUNDATION & ITS ENVIRONMENT (Part-IX)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# <u>ව්‍යාපාරවලට බලපෑම් කරන සාර්ව පරිසර බලවේග</u>

- ආර්ථික පරිසරය
- දේශපාලන පරිසරය
- නෛතික පරිසරය
- තාක්ෂණික පරිසරය
- ප්‍රජා පරිසරය
- ස්වාභාවික පරිසරය
- සමාජීය හා සංස්කෘතික පරිසරය
- ගෝලීය පරිසරය

එක් එක් සාර්ව පරිසර බලවේගය ව්‍යාපාරවල පැවැත්මට බලපෑම් ඇති කරන ආකාරය පහත දැක්වේ.

ClassWork.LK

# දේශපාලන පරිසරය

රාජ්‍ය නියෝජිත ආයතන, පවතින රජයේ දේශපාලන ප්‍රතිපත්ති ව්‍යාපාරවලට බලපෑම් කරයි.

**නිදසුන් :**

- රජයේ දේශපාලන දර්ශනය හා ප්‍රතිපත්ති
- විවෘත ආර්ථික ප්‍රතිපත්ති අනුගමනය කිරීම

එමගින් ඇති වන ව්‍යාපාර අවස්ථාවලින් ප්‍රයෝජන ගැනීමටත් තර්ජනවලට මුහුණදීමටත් ව්‍යාපාර උත්සාහ ගත යුතු ය.

# නෛතික පරිසරය

රජයේ අණපනත් හා පනවන නීති රීති එම රටේ ව්‍යාපාර කෙරෙහි බලපෑම් කරයි.

**නිදසුන් :**

- පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත
- කම්කරු නීති රීති
- ශ්‍රී ලංකා ප්‍රමිති පනත

මෙම නීති රීති හා අණපනත්වලට අනුකූල ව ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමටත් එමගින් ඇතිවන අවස්ථා

ClassWork.LK

හා තර්ජනවලට මුහුණදීමටත් ව්‍යාපාර උත්සාහ ගත යුතු ය.

## ආර්ථික පරිසරය

ව්‍යාපාරවල පැවැත්ම සඳහා ජනතාවගේ ක්‍රය ශක්තිය බලපාන අතර ව්‍යාපාර කටයුතු සඳහා දැරීමට සිදු වන පිරිවැය ද ආර්ථික සාධක මත රඳාපවතී.

**නිදසුන් :**

- මිල උද්ධමනය, පොළී අනුපාතය, දළ ජාතික නිෂ්පාදිතය, සේවා නියුක්තිය, ජීවන වියදම, ආදායම බෙදීයාමේ විෂමතාව, ඉතිරිකිරීම්, ආයෝජන

මෙම සාධක ව්‍යාපාර කෙරෙහි බලපෑම් කරන අතර ඉන් ඇති වන අවස්ථාවලින් ප්‍රයෝජන ගැනීමටත් තර්ජනවලට මුහුණ දීමටත් ව්‍යාපාර කටයුතු කළ යුතු ය.

## සමාජ හා සංස්කෘතික පරිසරය

පුද්ගලයින් තුළ ඇති විශ්වාස, සමාජ සාරධර්ම යනාදිය සමාජ හා සංස්කෘතික පරිසරය තුළ අන්තර්ගත වේ.

**නිදසුන් :**

- පුද්ගලයින් තුළ පවත්නා විශ්වාස

ClassWork.LK

- පුද්ගලයින් තුළ පවත්නා වටිනාකම්
- සිරිත් විරිත්
- සිතුම් පැතුම්
- ආගමික විශ්වාස

මෙම සාධක ව්‍යාපාර කෙරෙහි බලපෑම් කරන අතර ඒවාට අනුගත වෙමින් ව්‍යාපාර කර ගෙන යාමට සිදු වේ.

## තාක්ෂණික පරිසරය

සන්නිවේදන තාක්ෂණයේ ප්‍රවණතා සහ කෘෂිකාර්මික, කාර්මික, වෛද්‍ය හා අනෙකුත් ක්ෂේත්‍රවල සිදු වී ඇති තාක්ෂණික වෙනස්කම් තාක්ෂණික පරිසරයට අයත් වේ.

**නිදසුන් :**

- නව තාක්ෂණික සොයා ගැනීම්
- තාක්ෂණය සීග්‍රයෙන් වෙනස් වීම
- සන්නිවේදන තාක්ෂණයේ වෙනස් වීම්
- භාණ්ඩ යල් පැනීම

තාක්ෂණික පරිසරයේ වෙනස් වීම් හේතුවෙන් ඇති වන ව්‍යාපාර අවස්ථාවලින් ප්‍රයෝජන ගැනීමටත් තර්ජනවලට මුහුණ දීමටත් ව්‍යාපාර උත්සාහ ගත යුතු ය.

ClassWork.LK

# ප්‍රජා පරිසරය

ව්‍යාපාර සමග සම්බන්ධ වන ප්‍රධාන ම සාධකය ජනගහනයයි. එනම් වෙළෙඳපොළ සමන්විත වන්නේ පුද්ගලයන්ගෙනි.

**නිදසුන් :**

- ජනගහනයේ ප්‍රමාණය
- ජනවාර්ගික මිශ්‍රය
- ජනගහන වර්ධන අනුපාතය
- අධ්‍යාපන මට්ටම්
- ස්ත්‍රී /පුරුෂභාවය
- පවුලේ සංයුතිය
- වයස් ව්‍යුහය
- ගෘහ රටාව

ප්‍රජා පරිසරයේ ඇති වන ව්‍යාපාර අවස්ථාවලින් ප්‍රයෝජන ගැනීමටත් තර්ජනවලට මුහුණ දීමටත් ව්‍යාපාර උත්සාහ කළ යුතු ය.

ClassWork.LK

# ස්වාභාවික පරිසරය

ස්වභාවික සම්පත්වලට සිදු වන හානිදායක තත්ත්ව ගැන අද ගෝලීය වශයෙන් අවධානය යොමු වෙමින් පවතී. ලොවේ බොහෝ රටවල ව්‍යාපාර කටයුතු නිසා වාතය, ජලය සහ පස දූෂණයට ලක් ව ඇත. ස්වාභාවික පරිසරයේ යහපත් තත්ත්ව ඇති කරමින් ව්‍යාපාර කටයුතුවලට යොමු වීම පිළිබඳ ව නීතිරීති ද පනවා තිබේ.

ස්වාභාවික පරිසරයේ ඇති වන වෙනස්කම් ව්‍යාපාර කටයුතු කෙරෙහි බලපෑම් ඇති කරයි.

**නිදසුන් :**

- ස්වාභාවික සම්පත් සොයා ගැනීම
- කාලගුණික හා දේශගුණික වෙනස්වීම්
- භූමියේ පිහිටීම
- ස්වාභාවික විපත්

ස්වාභාවික පරිසරයේ ඇති වන ව්‍යාපාරික අවස්ථාවලින් ප්‍රයෝජන ගැනීමටත් තර්ජනවලට මුහුණ දීමටත් ව්‍යාපාරිකයා උත්සාහ ගත යුතු ය.

Class Work LK

# ගෝලීය පරිසරය

ගෝලීයකරණය හේතුවෙන් රටවල් අතර භාණ්ඩ හුවමාරු වීමට වැඩි අවස්ථාවක් සැලසී තිබේ. එසේ ම පුද්ගලයින්ගේ සංස්කෘතිය ද වෙනසකට ලක් ව තිබේ. මේ නිසා විවිධ භාණ්ඩ හා සේවා ලෝක වෙළෙඳපොළට එක් වී ඇත. දැඩි තරඟකාරිත්වයක් ද දක්නට ලැබේ.

**නිදසුන් :**

- වෙළෙඳ ගිවිසුම් ඇති වීම
- වෙළෙඳ හවුල් ඇති වීම
- ලෝක සංවිධාන බිහි වීම
- අන්තර්ජාතික වශයෙන් නීති රීති ඇති කිරීම
- ජනවාර්ගික මිශ්‍රය
- අධ්‍යාපන මට්ටම්
- පවුලේ සංයුතිය
- ගෘහ රටාව

ClassWork.LK

ගෝලීය පරිසරය තුළින් ඇති වන ව්‍යාපාර අවස්ථාවලින් ප්‍රයෝජන ගැනීමටත් තර්ජනවලට මුහුණ දීමටත් ව්‍යාපාරිකයා උත්සාහ ගත යුතු ය.

## සාර්ව පරිසර බලවේග ව්‍යාපාර කෙරෙහි ඇති කරන බලපෑම් සඳහා නිදසුන්

ප්‍රජා පරිසරය යටතේ ජනගහනය වැඩි වීම නිසා භාණ්ඩ හා සේවා සඳහා ඇති ඉල්ලුම වැඩි වීමෙන් ව්‍යාපාරවලට අවස්ථාව උදා වේ.

එසේ ම ජනගහනය අඩු වීම නිසා භාණ්ඩ හා සේවා සඳහා ඇති ඉල්ලුම පහළ යාමෙන් ව්‍යාපාරවලට තර්ජන මතු වේ.

ආර්ථික පරිසරය යටතේ පොළී අනුපාතය අඩු වීම නිසා ණය ගැනීම් වැඩි වී ව්‍යාපාර අවස්ථා උදාවේ. එසේ ම පොළී අනුපාතය වැඩි වීමෙන් ණය ගැනීම් සීමා වන අතර ව්‍යාපාරවලට තර්ජනවලට මුහුණ දීමට සිදු වේ.

දේශපාලන හා නෛතික පරිසරය යටතේ ව්‍යාපාරිකයින්ට හිතකර නීති රීති පැනවීමෙන් ව්‍යාපාර අවස්ථා උදා වන අතර ව්‍යාපාරිකයනි ට් අහිත කර නීති රීති පැනවීමෙන් ව්‍යාපාරවලට තර්ජනවලට මුහුණ දීමට සිදු වේ.

ClassWork.LK

# සාර්ව පරිසර බලවේග, ආසන්න පරිසර බලවේග කෙරෙහි බලපෑම් ඇති කිරීම තුළින් ව්‍යාපාර කෙරෙහි මතු කරන අවස්ථා හෝ තර්ජන

භාණ්ඩ හා සේවාවල මිල මට්ටම වැඩි වීම නිසා සැපයුම්කරුවන් සපයන භාණ්ඩ හා සේවාවල මිල ද වැඩි වේ.

එසේ ම වැටුප් මට්ටම වැඩි වීම නිසා ආසන්න පරිසර බලවේගයක් වන ගනුදෙනුකරුවන්ගේ (පාරිභෝගිකයින්ගේ) ආදායම වැඩි වී භාණ්ඩ හා සේවාවලට ඇති ඉල්ලුම වැඩි වේ.

ClassWork.LK

# එක් එක් සාර්ව පරිසර බලවේග අතර අන්තර් සම්බන්ධතාවය

මැණික් ඉල්ලම් ස්වාභාවික පරිසරයට අයත් වේ. නමුත් එය ව්‍යාපාර කටයුත්තක් බවට පත් කිරීමේ දී නීතියේ අවසරය ලබා ගැනීමට අවශ්‍ය වේ.

වාණිජ බැංකු විසින් ගනුදෙනුකරුවන්ගේ පහසුව සඳහා නවීන තාක්ෂණිකි උපකරණයක් වන ටෙලර් යන්ත්‍රයක් සවිකිරීමේ දී මහ බැංකුවේ අවසරය ලබා ගැනීම අවශ්‍ය වේ.

මේ අනුව සාර්ව පරිසර බලවේග වෙන් වෙන් ව විස්තර කළ ද මේවා අතර අනත්ර් සම්බන්ධතාවක් පවතින බව පැහැදිලි වේ.

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

(English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura